සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2025.01

Learning Resource Centre
R
De Mazenod College
Kandana
56054

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I/II | කාලය / காலம் / Time: පැය 2 |

නම / பெயர் / Name .................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................................

සැළකිය යුතුයි.

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. වැවේ ජලය මනා පාලනයකින් යුතුව පිටතට ගැනීම සඳහා ඉදිකර ඇති විශිෂ්ට නිර්මාණය වන්නේ,
(1) සොරොව්ව ය. (2) බිසෝ කොටුව ය. (3) පිටවාන ය. (4) රළපනාව ය.

02. වව්නියා මන්නාරම ප්‍රධාන මංසන්ධිය අසළ මල්වතු ඔය හරහා ඉදිකර ඇති ස්ථාවර වේල්ලක් සහිත අමුණ,
(1) තේක්කම් අමුණයි. (2) ඇලහැර අමුණයි. (3) මිනිපේ අමුණයි. (4) හත්තොට අමුණ යි.

03. මැටි බඳුන් තැනීමේ කලාවේ පුළුල් පරිවර්තනයක් ඇති වීමට බලපෑ ප්‍රබලම සාධකය මින් කුමක් ද?
(1) ඉතා උසස් වර්ගයේ මැටි හමුවීම.
(2) පින්තාරු කිරීම සඳහා සුදුසු වර්ණ සොයා ගැනීම.
(3) මැටි භාජන ගින්නෙන් වියළා ශක්තිමත් කර ගැනීමට හැකි වීම.
(4) සකපෝරුව සොයා ගැනීම.

04. • පොළොන්නරුවේ කිරිවෙහෙර • දෙමළ මහා සෑය • දැදිගම කොටවෙහෙර
ඉහත දාගැබ් කරවූ රජතුමා මින් කවුරුන් ද?
(1) වළගම්බා රජතුමා (2) මහසෙන් රජතුමා
(3) මහා පරාක්‍රමබාහු රජතුමා (4) නිශ්ශංකමල්ල රජතුමා

05. රජරට සමයට අයත්වන කලාත්මක වටදාගෙය වනුයේ,
(1) පොළොන්නරු වටදාගෙය යි. (2) මැදිරිගිරිය වටදාගෙය යි.
(3) තිරියාය වටදාගෙය යි. (4) ථූපාරාම වටදාගෙය යි.

06. භාතිකාභය රජුගේ යැයි සැලකෙන රාජකීය ප්‍රතිමාව දක්නට ලැබෙන්නේ මින් කුමන දාගැබ අසළ දී ද?
(1) ජේතවනාරාමය (2) අභයගිරිය
(3) මිරිසවැටිය (4) රුවන්වැලි මහා සෑය

07. උඩරට රාජධානියේ බලයට පත් වූ පළමු නායක්කර් වංශික රජතුමා කවුරුන් ද?
(1) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (2) රාජාධිරාජසිංහ රජතුමා
(3) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (4) ශ්‍රී විජයරාජසිංහ රජතුමා

08. සේනාසම්මත වික්‍රමබාහු රජතුමා සම්බන්ධ නිවැරදි වගන්තිය තෝරන්න.
(1) කුසුමාසන දේවිය විවාහ කර ගැනීමෙන් නව රජ පෙළපතක් ඇරඹීම.
(2) ජෝතිය සිටුවරයා විසින් ඇතිකළ කැරැල්ලට මුහුණ දීම.
(3) සෙංකඩගල නගරය මුල් කර ගනිමින් වෙනම රාජධානියක් පිහිටුවීම.
(4) සීතාවක බලපෑමෙන් උඩරට රාජධානිය නිදහස් කර ගැනීම.

09. මහනුවර රාජ්‍ය සමයේ පන් කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් ඉසිලූ ප්‍රදේශයක් ලෙස සැලකෙන්නේ,
(1) දුම්බර (2) කොත්මලේ (3) පිළිමතලාව (4) හාරිස්පත්තුව

10. දඹුල්ල, දෙගල්දොරුව, දළඳා මාළිගාව ආදී ස්ථානවල බහුලව දැකිය හැකි චිත්‍ර අයත් වන්නේ මින් කුමන යුගයට ද?
(1) අනුරාධපුර (2) පොළොන්නරු (3) මහනුවර (4) කෝට්ටේ

11. ලන්දේසීන්ගේ සහාය ලබාගෙන පෘතුගීසීන් මෙරටින් නෙරපා හරින ලද රජතුමා කවුරුන් ද?
(1) පළමුවන විමලධර්මසූරිය රජතුමා (2) සෙනරත් රජතුමා
(3) පළමුවන රාජසිංහ රජතුමා (4) දෙවන රාජසිංහ රජතුමා

12. වර්තමානයේ බටහිර ඉන්දියා දූපත් නමින් හඳුන්වනු ලබන ඉස්පැනියෝලා දූපත සොයා ගැනීමේ ගෞරවය හිමිවන්නේ,
(1) පර්ඩිනන්ඩ් මැගලන්ට ය. (2) ක්‍රිස්ටෝපර් කොළොම්බස්ට ය.
(3) වස්කෝ ද ගාමාට ය. (4) බර්තෝලමියුඩයස්ට ය.

13. දාහතරවන සියවස අග භාගය වන විට යුරෝපයේ ප්‍රධාන වෙළෙඳ මාර්ග තුනක් ආසියාතික ප්‍රදේශවලට වැටී තිබුණි. ඒ කුමන නගරය මුල් කරගෙන ද?
(1) ජිනෝවා (2) රෝමය (3) වැනීසිය (4) කොන්ස්තන්තිනෝපල්

14. ලන්දේසීන්ගේ පෙරදිග මූලස්ථානය පිහිටුවන ලද්දේ කුමන ප්‍රදේශයක ද?
(1) බතාවිය (2) ගෝව (3) කැලිකට් (4) මදුරාසිය

15. පහත ප්‍රකාශ අතුරින් නාවික හෙන්රි සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නාවික අභ්‍යාස විද්‍යාලයක් ආරම්භ කිරීම.
(2) ඔහු ලන්දේසි ජාතිකයෙකු වීම.
(3) තර්කශාස්ත්‍රය වැනි විෂයයන් පිළිබඳ අවබෝධයක් ලබා දීම.
(4) නාවික ශිල්පය ඉගැන්වීමට කටයුතු කිරීම.

- දී ඇති ලෝක සිතියම උපයෝගී කර ගනිමින් අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු තෝරන්න.




16. පෘතුගාලය දැක්වෙන අක්ෂරය,
(1) A (2) B (3) C (4) D

17. සුභ පැතීමේ තුඩුව දැක්වෙන අක්ෂරය,
(1) A (2) B (3) C (4) G

18. චීනය දැක්වෙන අක්ෂරය,
(1) B (2) D (3) H (4) G

19. පර්සියන් බොක්ක දැක්වෙන අක්ෂරය
(1) B (2) E (3) F (4) J

20. මිසරය (ඊජිප්තුව) දැක්වෙන අක්ෂරය
(1) A (2) C (3) H (4) G

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

සැලකිය යුතුයි:
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **අනෙකුත් ප්‍රශ්න අතුරින් හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.**

01. පහත A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

අ. i. A වලින් දැක්වෙන නිර්මාණය හඳුනාගෙන නම් කරන්න.
ii. මෙය දක්නට ලැබෙන ඓතිහාසික නගරයේ නම කුමක් ද?
iii. මෙය කුමන ආගමකට අයත් වේ ද?
iv. මෙය නිර්මාණය කර ඇති වාස්තු විද්‍යා ශෛලිය කුමක් ද?



A



B

ආ. i. B රූපයේ දැක්වෙන රජතුමාගේ නම කුමක් ද?
ii. රජවීමට පෙර මෙතුමා හැඳින්වූයේ කුමන නමින් ද?
iii. උඩරට ප්‍රභුවරයෙකු වූ මෙම රජතුමාගේ පියා කවුරුන් ද?
iv. මෙම රජතුමා රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීමට විවාහ කරගත් කුමරියගේ නම කුමක් ද?

(ලකුණු 2 x 8 = 16)

02. i. මහාවංසයේ සඳහන් වන පරිදි පණ්ඩුකාභය රජතුමා විසින් ඉදිකරන ලදැයි සැලකෙන වැව්වලින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. අතීතයේ මහවැව් තැනවූ රජවරු දෙදෙනෙක් නම් කර, ඔවුන් විසින් තනන ලද වැව් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පුරාණ කාලයේ දී ගම්වලට අවශ්‍ය කුඩා ප්‍රමාණයේ වැව් තනාගත් ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

03. i. අනුරාධපුර සහ පොළොන්නරු රාජධානි සමයේ ඉදි කළ පොකුණු අතුරින් අලංකාරය සඳහා තැනූ පොකුණු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ඇළවල් තැනීමේ අවශ්‍යතා දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. සීගිරි ජල උද්‍යානය තුළ දක්නට ලැබෙන ලක්ෂණ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04. i. පොළොන්නරු යුගයේ සඳකඩ පහනේ කැටයම් කර ඇති සත්ත්ව රූපවල නම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. පුරාණ ආරෝග්‍යශාලා අසළින් හමු වූ දේවල් හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

iii. අතීතයේ මෙරට ලෝහ තාක්ෂණය ඉතා දියුණු මට්ටමක පැවති බව උදාහරණ දෙකක් සහිතව විස්තර කරන්න. (ලකුණු 05)

05. i. උඩරට රාජධානියට ස්වභාවිකව ආරක්ෂාව සැළසුනු

A - ගංගාවක්

B - කඳුවැටියක් නම් කරන්න. (ලකුණු 02)

ii. උඩරට රාජධානි සමයේ අපනයනය කළ වෙළෙඳ ද්‍රව්‍ය හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. මහනුවර රාජධානියේ සමාජය තුළ දක්නට ලැබුණු ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. i. මධ්‍යතන යුගයේ අවසානයේ දී පහත සඳහන් රටවල බිහි වූ විශ්වවිද්‍යාල එක බැගින් A, B අනුපිළිවෙළට ලියන්න.

A - ඉතාලිය:

B - එංගලන්තය: (ලකුණු 02)

ii. පහත සඳහන් දෑ ලොවට දායාද කළ පුද්ගලයින් A, B, C, D අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - දුරේක්ෂය නිපදවීම:

B - මොනාලිසා චිත්‍රය:

C - ඩේවිඩ්ගේ ප්‍රතිමාව:

D - මුද්‍රණ යන්ත්‍රය (ලකුණු 04)

iii. (a) දේශ ගවේෂණවලට බලපෑ හේතු දෙකක් ලියන්න.

(b) ඉන් එක් හේතුවක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07. i. පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණි අවධියේ දී පහත සඳහන් රාජධානිවල සිටි පාලකයින් කවුරුන් දැයි අනුපිළිවෙළින් ලියන්න.

A - කෝට්ටේ රාජධානිය:

B - යාපනය රාජධානිය: (ලකුණු 02)

ii. පහත සඳහන් පෘතුගීසි සෙන්පතියන්ගේ නායකත්වය යටතේ උඩරට ආක්‍රමණ සිදු වූ ස්ථාන වරහන තුළින් තෝරා A, B, C, D අනුපිළිවෙළට ලියන්න.
(දන්තුරේ, රන්දෙනිවල, බලන, ගන්නොරුව)

A - දියෝගු ද මේලෝ:

B - පේරෝලෝපෙස් ද සූසා:

C - දොන් ජෙරනිමෝ ද අසවේදු:

D - කොන්ස්තන්තිනු ද සා: (ලකුණු 04)

iii. පෘතුගීසින්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

******